කොවිඩ් 19 සති පාසල

සබරගමුව

විෂය - පුරවැසි අධ්‍යාපනය ශ්‍රේණිය - 09 ශ්‍රේණිය වාරය - III

සතිය - 5 සතිය

ඒකකය - 9.6 වැඩ ලෝකයට සූදානම් වෙයි.

**ක්‍රියාකාරකම** - 9.6.1 මනාව සැලසුම් කරන ලද පෞද්ගලික ගොනුවක් පවත්වාගෙන යාමේ වැදගත්කම අගය කරයි.

**හැඳින්වීම** - වර්තමාන අධ්‍යාපනයේ ප්‍රධාන වගකීමක් වන්නේ යහපත් පුරවැසියන් සමාජයට දායාද කිරීමයි.පාසල් අධ්‍යාපනයේ මූලික අරමුණ සමාජයට වැඩදායි පුද්ගලයෙකු බිහි කරදීමයි.අනාගත වැඩ ලෝකයට සාර්ථකව මුහුණදීම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශ ලබාදීමද සිදුවේ.ඒ අනුව වැඩ ලෝකය හෙවත් රැකියා ලෝකය ගවේෂණය කරමින් කාර්යක්ෂම හා ගුණාත්මක සේවයක් රටට ලබාදීම සඳහා අනාගත වෘත්තියකට පිවිසීමට අවශ්‍ය පසුබිම සැකසීම මෙම පරිච්ඡේදයේ අරමුණයි.

ඔබ 8 වන ශ්‍රේණියේදි වැඩ ලෝකය පිළිබඳව උගත් කරුණුද සිහිපත් කර ගන්න.

**වැඩ ලෝකය ජයගැනීමට නම්**

- ❖ අනාගත රැකියා අපේක්ෂා තෝරා ගැනීම.
- ❖ එම රැකියා අපේක්ෂා වලට අවශ්‍ය සුදුසුකම් සපුරා ගැනීම වැදගත් වේ.

**ගුණාත්මක යෙදවුම්** - පෙළපොත/ පුවත්පත් හෝ ජනමාධ්‍ය තොරතුරු /වැඩිහිටි දායකත්වය

**ක්‍රියාකාරකම සඳහා සිසුන්ට උපදෙස් ,**

**පියවර 1-** පෙළපොතේ 122 -125 දක්වා අවබෝධයෙන් කියවන්න.

**පියවර 2-** පෙර පරිදිම අභ්‍යාස පොත භාවිතා කර හැඳින්වීම කියවා අවබෝධ කරගෙන ප්‍රශ්න ලියා පිළිතුරු සපයන්න.

ප්‍රශ්නාවලිය.

01. වැඩලෝකය යනු කුමක්ද ?
02. වැඩ ලෝකයේ ඇති ඔබ කැමති රැකියා අවස්ථා 5ක් ලියන්න.
03. පෞද්ගලික ගොනුවක ඇතුලත් විය යුතු යැයි සැළකෙන ප්‍රධාන කරුණු හය සඳහන් කර,ඒ යටතේ ඇතුළත් විය යුතු තොරතුරු මොනවාද ?
04. පෞද්ගලික ගොනුවක් පවත්වා ගැනීම වැදගත් වන්නේ ඇයි ?

**පසු වැඩ -** ඔබගේ දත්ත ඇතුලත් කර පෞද්ගලික ගොනුවක් සකස් කරන්න.එය සිත් ගන්නා සුළු ආකාරයෙන් සකස් කර දිගටම පවත්වාගෙන යන්න.

**සැකසීම - M.A පද්මලතා,පළාවෙල ශ්‍රී රත්නාකර විද්‍යාලය,**

**රත්නපුර**